# ලියෝ සමාජයේ නව සාමාජිකයින් ස්ථාපනය කිරීම

අද දින අභිනවයෙන් ලියෝ සමාජයට එකතුවන සාමාජික සාමාජිකාවන් බඳවාගැනීමට කටයුතු කරන අවස්ථාවයි මේ. ඒ නිසා ඔබ සියළුදෙනාම ඉතාමත් නිශ්චලවල සාවදානව මෙම වැදගත් අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිමි.

නව ලියෝ සාමාජිකයන් මෙම වේදිකාව ඉදිරියට පැමිණෙන්න.

ඔබ සියළුදෙනාටම මෙම ලියෝ සමාජයේ සාමාජිකත්වය ලැබීමට ආරාධනා ලැබී ඇති හෙයින් එය භාරගැනීම පිළිබඳව අපි ඉතා සතුටු වෙමු. ඔබ දැන් මේ සූදානම් වන්නේ ලෝකයේ තිබෙන විශාල සේවා සංවිධානයක් වූ ජාත්‍යන්තර සිංහ සමාජයේ නායකත්වය පුහුණු කරනු වස් තරුණ තරුණියන්ගේ හැකියාවන් විදාපෑම පිණිස 1967 ආරම්භ කරන ලද ලියෝ සමාජ සාමාජිකත්වය ලබාගැනීමටයි. ඒ වගේම ලියෝ සමාජයේ අරමුණ වන්නේ උසස් චිත්ත ධෛර්යය ඇතිව, පෞද්ගලිකවම වගකීම් දැරීමේ ශක්තිය, චිත්ත ප්‍රීතිය සහ අන්‍යෝන්‍ය අවබෝධය ඇතිකිරීම මෙන්ම පිළිසරණ විය යුතු අයට ආධාර උපකාර කිරීම ආදියයි. ඔබ ලියෝ සාමාජිකත්වය ලබාගැනීමේදී සමාජයේ අභියෝග වලට නිසි ලෙස මුහුණදීමට හැකියාව ලැබේ. එම අභියෝග සාක්ෂාත් කරගැනීමේදී ඔබ සහයෝගීතාවයෙන් කටයුතු කළ යුතු අතර එම සහයෝගීතාවය තුළින් ඔබ ලියෝ සමාජයේ ඉතාමත් හොඳින් කටයුතු කළා යැයි සතුටු විය හැකියි. මෙහිදී විශේෂයෙන් සමාජයේ සේවය ලැබිය යුතු අයට සේවය කිරීමට හැකිවන අතර නායකත්වයට පුහුණුවීමේ අවස්ථාවද ඔබට ලැබෙනු ඇත.

නැවත වරක් මා ඔබට සුබ පතන අතර ලියෝ සමාජයේ සාමාජිකත්වය පිළිගනු වස් ඔබගේ දකුණු අත ඔසවා සාමාජිකත්වයේ ප්‍රතිඥාව මා සමඟ කියවන්න

.................................................... වන මම .................................................... සිංහ සමාජයේ සභාපති සහ ලියෝ උපදේශක ඉදිරිපිට ගාම්භීරතා පූර්වකව .................................................... ලියෝ සමාජයේ සාමාජිකත්වය භාරගත් බවත්, එහි ඇති වගකීම් ව්‍යවස්ථානුකූලව පිළිපැදීමටත්, සියළුම රැස්වීම් වලට නිතිපතා සහභාගි වීමටත්, ව්‍යාපෘති වලට උපරිම සහාය ලබාදීමටත්, තමුන් විසින් ලබාදිය යුතු හා ඉටුවිය යුතු කාර්යභාරය නිර්ලෝභීව ඉෂ්ටකිරීමට මූල්‍යමය වශයෙන් සහයෝගීතාවය ලබාදීමටත්, තවදුරටත් සෑම අවස්ථාවකම ලියෝ සමාජයේ කර්තව්‍යයන් ඉහළ මට්ටමකට ගෙන ඒමටත්, ලියෝ සමාජ සාමාජිකත්වය වර්ධනය කිරීමටත් කටයුතු කරන බවත් පොරොන්දු වෙමි. මෙම ලබාගත් අවස්ථාවෙන් මාගේ නායකත්ව ගුණාංග වැඩිදියුණු කරගනිමින්, ලියෝ සමාජයේ වැඩකටයුතු වල ගුණාත්මක බවත්, එම කාර්යය කිරීමේදී මා ලබන සතුට මෙන්ම ලියෝ සමාජයට ඇති පක්ෂපාතීත්වය හා ලියෝ සමාජයේ ගෞරවය රැකෙන පරිදි කටයුතු කිරීමටද නව ලියෝ සාමාජිකයෙක් ලෙස මම පොරොන්දු වෙමි.